මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097 | ලේකම් / செயலாளர் / Secretary: 081-2213096 | සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary: 081-2213097 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082 |

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No.: CPC/PSC/06/20(V3) | ඔබේ අංකය / உமது இல / Your No.: | දිනය / திகதி / Date: 2026.01.12 |

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් වෙත,

## මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය -2025

උක්ත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **2026.01.24 වන** දින මහනුවර විද්‍යාර්ථ විද්‍යාලයේදී පැවැත්වීමට නියමිත අතර, මෙම විභාගය සඳහා අයදුම් කරන ලද අයදුම්කරුවන් අතුරින් නියමිත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර, ඔවුන් විසින් අයදුම්පතේ සඳහන් ජංගම දුරකථන අංක වෙත කෙටි පණිවිඩ (sms) මඟින් යොමු කර ඇති බව කාරුණිකව දන්වමි.

02. ප්‍රවේශපත්‍රයෙහි දෘඪ පිටපත් නිකුත් නොකරන අතර, කෙටි පණිවිඩයේ දිගුවට (link) ගොස් ප්‍රවේශපත්‍රය බාගත කරගත යුතු ය. ඉන් අනතුරුව ප්‍රවේශපත්‍රය A4 කඩදාසියක දෙපස මුද්‍රණය කර ගතයුතුය. අත්සන් සහතික කර ගැනීම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව යාවත්කාලීන වන ආයතනයේ ආයතන ප්‍රධානියා හෝ බලය පවරන නිලධාරියෙකු වෙතින් සිදුකළ යුතුය.

03. යම් හෙයකින් උක්ත විභාගය සඳහා අයදුම්කළ නමුත් ප්‍රවේශපත්‍රය නොලැබුණේනම් හෝ තමන් වෙත ලද ප්‍රවේශපත්‍රයේ යම් ගැටළුවක් ඇත්නම් 2026.01.13 දිනෙන් පසු මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශය වෙතින් (081-2213097) විමසිය යුතුය. 2026.01.21 දිනෙන් පසුව උක්ත විභාගය සම්බන්ධයෙන් සිදුකරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

04. මේ සම්බන්ධව අදාළ නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී.විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.